**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය - 2018**

-------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම අධිකාරියේ සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය ප්‍රකාරව අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත්, ගිණුම් තැබීමේ දෝෂ හේතුවෙන් දිගුකාලයක සිට පැවති ව්‍යාපෘති අරමුදල් හතරක එකතුව රු.1,657,000 ක් වූ හර ශේෂ සහ අරමුදල් හයක එකතුව රු.3,258,669 ක් වූ බැර ශේෂ නිරවුල් කිරීමකින් තොරව එකිනෙකට හිලව් කර රු.1,601,669 ක් වූ ශුද්ධ බැර ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබුණි. | ඉදිරියේ දී හර හා බැර ශේෂ වෙන වෙනම ශේෂපත්‍රයේ දැක්වීමට කටයුතු කරන බව හා ශේෂයන්ගේ කොටසක් නිරවුල් කිරීමට කටයුතු කර ඇති බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 69 වන ඡේදය අනුව වත්කම් ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසුවය. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගන්නා ලද රු.4,358,003 ක් වටිනා වත්කම් වෙනුවෙන් සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කිරීම හේතුවෙන් වර්ෂයේ ක්ෂය රු.701,926 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | අධිකාරිය අඛණ්ඩව පවත්වා ගෙන යන ප්‍රතිපත්තියක් බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම් වල ක්ෂය වියදම හඳුනාගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 55 වන ඡේදයට පටහැනිව මෝටර් රථ 2 ක් ප්‍රත්‍යාගණන කිරීමෙන් වූ ප්‍රත්‍යාගණන අතිරික්තය 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම රු.965,000 බැගින් වාර්ෂිකව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ විලම්භිත ආදායම් ලෙස ගලපා තිබුණි. | වාර්ෂිකව ක්ෂය කරන ප්‍රමාණයට සමාන වටිනාකමක්, ප්‍රත්‍යාගණන වෙන් කිරීමේ ගිණුම හර කර ආදායම් ගිණුමට බැර කරන බවත්, එසේ නොකලහොත් මෙම වටිනාකම සංචිතයක් වශයෙන් පොත්වල දිගින් දිගටම ඉදිරියට යන බව. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

### 1.5.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ළමා ආරක්ෂක අධිකාරිය හා ළමා ආරක්ෂක අරමුදල අතර, සිදුවන අන්තර් ගනුදෙනු නිසි පරිදි සටහන් නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියට අරමුදලෙන් ලැබිය යුතු ශේෂයේ හා අධිකාරියෙන් අරමුදලට ගෙවිය යුතු ශේෂයේ පිළිවෙලින් රු.842,874 ක හා රු.3,236,982 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අන්තර් ගනුදෙනු නිසි පරිදි සටහන් කල යුතු අතර, ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ අතර වෙනස්කම් නිරවුල් කිරීමට හෝ සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කල යුතු වීම. |

### 1.5.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ළමා ආරක්ෂක අරමුදලින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ගෙවිය යුතු ශේෂය ලෙස රු.6,739,327 ක් හා ලැබිය යුතු ශේෂය ලෙස රු.7,582,201 ක් වසර 4 කට අධික කාලයක සිට පැවත එන නමුත් එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින යුනිසෙෆ් සහ සේව් ද චිල්රන්ඩ් යන අරමුදල්වලින් පිළිවෙලින් 2006 සහ 2013 වර්ෂවල ලැබිය යුතු ලෙස රු.235,379 ක් හා රු.256,510 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණ ද, එම ශේෂ අයවීම අවිනිශ්චිතව පැවතුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ඇ) | වර්ෂ 3 කට වඩා වැඩි කාලයක සිට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ පිළිවෙලින් අධිකාරියට ලැබිය යුතු හා අධිකාරියට ගෙවිය යුතු ලෙස සටහන් කර ඇති රු.804,851 ක වටිනාකම හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට හෝ අයකර ගැනීමට කටයුතු කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.7,438,888 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.18,498,673 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,059,785 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාර ප්‍රදාන රු.11,223,189 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ 1929 දුරකථන අංකයට ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ක්රියාත්මක වීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකස් කිරීම සහ අදාල ක්‍රමවේදය වැඩි දියුණු කිරීමට නිර්දේශ ලබා ගැනීම වෙනුවෙන් උපදේශිකාවක් වෙත 2016 / 2017 වර්ෂවල දී රු.900,000 ක් ගෙවා තිබුණි. එම නිර්දේශ ලබා දී වර්ෂ දෙකක කාලයක් ගත වී තිබුණ ද, එහි ඇතුළත් නිර්දේශ හා ක්‍රමවේද අනුගමනය කිරීම කෙරෙහි කළමනාකරණයෙහි අවධානය යොමු වී නොතිබුණි. | 1929 මෘදුකාංගය සමඟ නොගැලපීම නිසා මෙම දත්ත පද්ධතිය නැවත වැඩිදියුණු කිරීමට සිදු වූ බව. | අදාල නිර්දේශ හා ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට හෝ යාන්ත්‍රණය විධිමත් කිරීමට කටයුතු කල යුතුය. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරියේ සේවයේ නියුක්ත නිලධාරීන් ඒ ඒ තනතුරුවල රඳවා ගැනීම සඳහා බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා වැටුප් තලයන් සංශෝධනය කිරීම වැනි කාර්යයන් දීර්ඝ කාලයක සිට සිදු කර නොමැති වීම හේතුවෙන් සේවක පිරිවැටුම ඉහළ යාමත් පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා නොගැනීම නිසා අධිකාරියේ අරමුණු ඉටු කිරීමේ ප්‍රමාදය විගණනයේ දී නිරීක්ෂණය විය. | පිළිතුරු ලැබී නොමැත. | නව නිලධාරීන් බඳවා ගැනීම සහ සේවයේ නියුක්ත නිලධාරීන් රඳවා ගැනීම සඳහා විධිමත් කළමනාකරණ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වීම. |
| (ආ) | සෑම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම අනුයුක්ත කර ඇති ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ළමා ආරක්ෂක නිලධාරීන් හා දිස්ත්‍රික් මනෝ සමාජීය නිලධාරීන් පිළිබඳව දීර්ඝ කාලයක සිට නිසි අධීක්ෂණයක් නොකිරීම හේතුවෙන් අධිකාරියට වාර්තා වන ලිංගික අපයෝජන, අපචාර හා ළමා කෲරත්ව ආදී පැමිණිලි වර්ධනය වී තිබූ අතර, එම පැමිණිලි විසඳා අවසන් කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | සෑම නිලධාරියෙකුගේම කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.3 වෙනත් සංවිධානවලට මුදාහල සම්පත්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (වැඩසටහන්) තනතුර දැරූ නිලධාරිනිය වසර 8 කට වැඩි කාලයක සිට වැටුප් හා දීමනා ප්‍රතිපූරණය කිරීමේ පදනම මත වෙනත් අමාත්‍යාංශයක සේවය සඳහා මුදා හැර තිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | අදාල නිලධාරිනිය ගෙන්වා ගැනීමට හෝ එම තනතුර සඳහා වෙනත් නිලධාරියෙකු ගේ සේවය ලබා ගැනීමට හෝ කටයුතු කළ යුතු වීම. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | පාසල් ළමා ආරක්ෂක කමිටු පිහිටුවීම සඳහා සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පසුගිය වර්ෂ 8 ක කාලපරිච්ඡේදය තුළ අධිකාරිය විසින් රු.29,058,645 ක් වැය කර තිබුණි. දිවයිනේ 10,194 ක් වූ මුළු පාසල් සංඛ්‍යාවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ළමා ආරක්ෂක කමිටු පිහිටු වූ පාසල් සංඛ්‍යාව 3,615 ක් වන අතර, එය සියයට 35 ක් පමණක් විය. ඉන් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින පාසල් ප්‍රමාණය 2,392 ක් වූ අතර, එය මුළු පාසල් සංඛ්‍යාවෙන් සියයට 23 ක් පමණක් විය. | පිළිතුරු ලැබී නොමැත. | ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමත් පසු විපරම් කිරීමත් සිදු කල යුතු වීම. |
| (ආ) | හදිසි ආපදා තත්ත්වයන් හි දී පිළිපැදිය යුතු ළමා ආරක්ෂාව සඳහා වන මාර්ගෝපදේශය, ළමා නිවාස සඳහා වන මාර්ගෝපදේශය, ළමා සුරැකුම් පාඨමාලාවේ පුහුණුකරුවන්ගේ මාර්ගෝපදේශ අත්පොත හා එහි පිටපත් 500 ක් මුද්‍රණය කිරීම හා දෙමාපියන් සඳහා වන ධනාත්මක ශික්ෂණය පිළිබඳ මාර්ගෝපදේශය මුද්‍රණය කිරීම සඳහා රු.1,800,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද, එම කාර්යයන් ඉටු කර නොතිබුණි. | ඇණවුම භාර දීමට කටයුතු කර ඇති අතර, 2019 වර්ෂය තුළ අවසන් කරන බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අන්තර්ජාල සුරක්ෂිතතාවය පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් 9 ක් සහ අන්තර්ජාලය හරහා සිදුවන අපචාර සිද්ධි 100 ක් සම්බන්ධයෙන් අන්තර්ජාල විමර්ශන පහසුකරණය සහ නඩත්තු පහසුකම් පවත්වා ගෙන යාම සඳහා රු.780,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද, රු.63,000 ක් වැය කර සිද්ධි 24 ක් සම්බන්ධයෙන් පමණක් කටයුතු කර තිබුණි. | පිළිතුරු ලැබී නොමැත | ක්‍රියාකාරී සැලැස්මට අනුකූල විය යුතුය. |
| (ඇ) | අධිකාරිය විසින් පිළියෙල කරන ලද සමාජ ආරක්ෂණ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යභාරයන් 9 ක් ඇතුළත් කර රු. මිලියන 20 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කාර්යයන් 7 ක් ආරම්භ කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී එම වර්ෂය තුලදීම ක්‍රියාත්මක කිරීමට හැකි වැඩසටහන් පමණක් ඇතුලත් කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතු වීම. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 ජූනි 09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/2009 /(1) හි 3 ඡේදයට අනුව අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්ත කර නොතිබුණි. | පිළිතුරු ලැබී නොමැත. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතු වීම. |

**4.3 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැය ගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සියයට 14 සිට සියයට 771 දක්වා පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය විය. | පිළිතුරු ලැබී නොමැත. | අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදා ගත යුතු වීම. |

**4.4 තිරසාර සංවර්ධන අරමුණු**

**විගණන නිරීක්ෂණ**

තිරසර සංවර්ධනය පිළිබඳ 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව, සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුය. එම විෂය පථයට වැටෙන කාර්යයන් සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනා ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

පිළිතුරු ලැබී නොමැත.

**නිර්දේශය**

අදාල ලිපි හා චක්‍රලේඛ ප්‍රකාරව අරමුණු හා ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වීම.